2017 ජූලි - දෙසැම්බර් වෙළුම I

CENTRAL BANK OF SRI LANKA

# ප්‍රාදේශීය පුවත් - මාතර
# ශ්‍රී ලංකා මහ බැංකුව

## නියෝජ්‍ය අධිපතිතුමන්ගේ පණිවුඩය;

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල විසින් ප්‍රාදේශීය මට්ටමින් ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් මහ බැංකුවේ ප්‍රධාන අරමුණු ද්විත්වය වන ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා සිය දායකත්වය සපයනු ලබයි.

ප්‍රාදේශීය කාර්යාල මගින් සිදු වන්නාවූ වැදගත් කාර්යයන් පිළිබඳව දැනුවත් කිරීම ප්‍රමාණවත් මට්ටමක නොපවතින අතර, මහ බැංකුවේ බොහෝ පිරිසක් ද එම කටයුතු පිළිබඳ දැනුවත්භාවයක් නොදක්වයි. එවන් වටපිටාවක දකුණු පළාත තුළ ක්‍රියාත්මක වන මාතර ප්‍රාදේශීය කාර්යාලය තම කටයුතු පිළිබඳව අන් අය දැනුවත් කිරීම උදෙසා සකසනු ලැබූ මෙම විද්‍යුත් සඟරාව මහ බැංකුව තුළ පවත්නා එම සන්නිවේදන පරතරය පියවීමට උපකාරවන බව මගේ හැඟීමයි.

මුද්‍රිත මාධ්‍ය භාවිතයට වඩා ඉතා අඩු පිරිවැයක් සහිතව ඉතා වැඩි වේගයකින් සන්නිවේදනය කළ හැකි විද්‍යුත් සඟරා ක්‍රමය යොදා ගැනීම තුළින් මෙම කාර්යය ඉතා සාර්ථක වන බව නොඅනුමානය. මෙම ආරම්භය සඳහා මාතර ප්‍රාදේශීය කාර්යාලයේ කළමනාකාරතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ශුභාශිංසන පිරිනමන අතර, ප්‍රාදේශීය කාර්යාලයේ ඉදිරි කටයුතු සඳහා ද සුබ පැතුම් එක් කරමි.

**කේ.ඩී. රණසිංහ**
**නියෝජ්‍ය අධිපති**

## සහකාර අධිපතිතුමන්ගේ පණිවුඩය;

මූල්‍ය පහසුකම්, මග පෙන්වීම් හා අලෙවිකරණයට අදාළ සේවා බාධාවකින් තොරව හා නියමිත කාලයට ලබා දීම, ඒවාට අදාළ සේවා සම්බන්ධීකරණය කිරීම තුළින් ප්‍රාදේශීය ආර්ථිකය දිරි ගැන්වීම හා ප්‍රචලිත කිරීම, විවිධ වූ සංවර්ධන කාර්යයන් තුළින් අදාල ප්‍රදේශයන්හි දිළිඳුබව අවම කිරීම, ආර්ථික සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කරලීම සහ අදාල ප්‍රදේශයන්හි ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික කාර්යයන් ස්ථාපනය කිරීමට හා සම්බන්ධීකරණය කිරීමට සහයෝගය දැක්වීම අරමුණු කර ගෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා තිබේ. ඒ අනුව, පිහිටවූ ප්‍රථම ප්‍රාදේශීය කාර්යාලය වන්නේ මාතර ප්‍රාදේශීය කාර්යාලයයි.

මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් තම ප්‍රදේශය තුළ සංවිධානය කරනු ලැබූ වැඩසටහන් පිළිබඳව සමාජය දැනුවත් කිරීම සඳහා සකසනු ලැබූ මෙම විද්‍යුත් සඟරාව සැබවින්ම අගය කොට සලකමි.

**එස්.ජේ.ඒ. හඳගම**
**සහකාර අධිපති**

## ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකතුමන්ගේ පණිවුඩය;

මෙම විද්‍යුත් සඟරාවට විශේෂයෙන් ඇතුලත්ව ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ඉටු කිරීමට අදාලව පවත්වන ලද සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තරයකි. ප්‍රදේශයේ පවත්නා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන සමඟ ද ඉතා හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන යමින්, ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම පරිදි දකුණු පළාතේ සංවර්ධනය සඳහා මාතර ප්‍රාදේශීය කාර්යාලය මහත් කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර, එම කටයුතු පිළිබඳව දැනුවත් කිරීම සඳහා විද්‍යුත් සඟරාවක් එළිදැක්වීම ඉතා අගය කරමි.

**එච්. අමරතුංග**
**අධ්‍යක්ෂ**
**ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපා:**


Lanka held up as model by World Bank

OPEC ready to fund projects

More banks for CD scheme

Secondary market for Treasury Bills

Banking division to made a public concernt

CENTRAL BANK OF CEYLON takes pleasure in announcing the opening of its 1st Regional Office at MATARA

74/1 Kumaratunga Mawatha

by Hon. Ronnie de Mel

On Sunday 29th March 1981 at 4.00 p.m.

Mr. Kirthi Abeywickrema,

Mr. S.K. Piyadasa,

A Cultural Show will follow.

ALL ARE WELCOME

Central Bank of Ceylon

CONTROL OF FINANCE COMPANIES ACT NO. 27 OF 1979

The attention of all non-banking financial institutions is drawn to the Control of Finance Companies (Advertisement) Rules No. 1 of 1981 made by the Monetary Board of the Central Bank of Ceylon under Section 18 of the Control of Finance Companies Act No. 27 of 1979. The Rules have been published in Gazette Extra-ordinary No. 150/7 of 21st July, 1981 and they come into effect from 1st September, 1981.



## .... ඇතුළත පිටු ....


1) පණිවුඩයන්
2) ප්‍රාදේශීය කාර්යාලය - මාතර
3) කාර්ය මණ්ඩලය
4) පැවැත් වූ වැඩසටහන්
   a. විධිමත් මූල්‍ය ආයතන හා සේවාවන් පිළිබඳ
   b. ව්‍යාජ මුදල් හා පිරිසිදු මුදල් පිළිබඳ
   c. මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ
5) ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්
   a. සහන පොළී ණය යෝජනා ක්‍රම පිළිබඳ
   b. පුහුණු වැඩසටහන්
   c. නව තාක්ෂණය හඳුන්වාදීම
6) ක්ෂේත්‍ර චාරිකාවන්
7) හැකියාවට ඉඩක්

# ....ප්‍රාදේශීය කාර්යාලය - මාතර.......

*ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක*

<u>*අපේ ඉතිහාසය*</u>




දකුණු පළාත් ඵලදායී සම්පත් සංවර්ධනය කිරීමේ කාර්යය දිරිගැන්වීම හා ප්‍රචලිත කිරීම අරමුණු කොටගෙන බැංකු ක්ෂේත්‍රයේ ද සහයෝගය සහිතව ශ්‍රී ලංකා මහ බැංකුවේ පළමු ප්‍රාදේශීය කාර්යාලය 1981 මාර්තු මස 29 දින, මාතර නගරයේ දී ස්ථාපනය කෙරුණි.

1983 දෙසැම්බර් මස 17 දින මාතර ප්‍රාදේශීය කාර්යාලය, මාතර අනගාරික ධර්මපාල මාවතේ අංක 35 දරන තැන පිහිටි වර්තමාන ගොඩනැගිල්ලට ගෙන එන ලදී.

වර්තමානය වන විට මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ප්‍රාදේශීය මට්ටමින් ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු ද්විත්වය වන ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා සිය දායකත්වය සපයනු ලබයි.

<u>*ප්‍රථම ගොඩනැගිල්ල විවෘත කළ දින සිහිවීමට ඇති සමරු සේයාරුව*</u>




(Seated) Left to Right:- Mrs. P. De A. Goonatilleke, Mr. W. Heenatigala, Mr. A. S. Jayawardana (Asst. to the Governor), Dr. H. N. S Karunatillaka (Senior Deputy Governor), Dr. W. Rasaputram (Governor), Mr. K. Kanagasabapathy (Deputy Governor Mr. T. G. Punchiappuhamy (Asst. to the Governor), Mr. P. Pattiarachchige (Regional Manager), Mr. M. A. Piyadas

Second Row :- Mr. L. Edirisinghe, Mr. I. Manamperi, Mr. W. R. M. Gunawardana, Mrs. G. H. B. Y. De Silva, Mr. C. Alahakoo Mr. M. E. Fernando, Mr. H. A. K. Bandusiri, Miss. R. P. D. Chandrika, Mr. K. D. K. Sarath, Mr. H. B. Karunasi Mr. R. E. Nanayakkara.

Third Row :- Mr. G. A. Karunatilleke, Mr. M. I. A. Cader, Mr. J L. Ariyadasa, Mr. H. P. G. S. Ratnasiri, Mr. P. Ekanayaka, Mr. K. G. Premada

*<u>මුදල් කෞතුකාගාරය - මාතර ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රය</u>*

2010 මැයි 06 දින එවකට අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා විසින් මාතර ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ මුදල් කෞතුකාගාරය විවෘත කරන ලදී.

මුදල් කොමසාරිස් මණ්ඩලය සහ පෞද්ගලික බැංකු විසින් නිකුත් කළ මුදල්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මේ දක්වා නිකුත් කළ නෝට්ටු කාණ්ඩ 11 හා සමරු කාසි, නෝට්ටු සියල්ලම මෙහි ප්‍රදර්ශනයට තබා තිබේ.



*<u>මාතර ප්‍රාදේශීය කාර්යාලය</u>*

එදා සහ අද






මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ඉතිහාසය 1981 තරම් ඈත අතීතයක් කරා විහිදී යයි. ඒ අනුව, 1981 මාර්තු මස 29 වෙනි දින ආරම්භ කරන ලද මාතර ප්‍රාදේශීය කාර්යාලය සිය මෙහෙයුම් කටයුතු වල හතරවන දශකය පසු කරමින් සිටි. නමුත් අප ප්‍රාදේශීය කාර්යාලය කාලයක් පුරාවට සාම්ප්‍රදායික ක්‍රමයටම, ආරම්භයේ සිටම පැවතුණු ගොඩනැගිල්ලෙන් හා ලී බඩු වලින් අවුරුදු 35 කට අධික කාලයක් පවත්වාගෙන යන ලදී.

කෙසේ වුවද 2017 වර්ෂයේදී, නවතම ලී බඩු වලින් හැඩ වී සේවය කිරීමට සුදුසු ආකර්ශනීය ස්ථානයක් බවට මාතර ප්‍රාදේශීය කාර්යාලය පත්ව ඇත.



# ...... කාර්ය මණ්ඩලය..........



මිගාර සම්පත් හදුන්ගේ මහතා

ප්‍රාදේශීය කළමනාකරු (වැ.බ.)



සුමුදු ගුණරත්න මහතා

කළමනාකරු



එම්.පී.අනුර මහතා

කළමනාකරු



ආර්.එන්. හෙට්ටිආරච්චි මහත්මිය

කළමනාකරු (වැ.බ.)



යූ.ඩබ්ලිව්.ඒ.පී.කේ. වීරරත්න මහත්මිය

කළමනාකරු (වැ.බ.)



ඒ.වී.එස්.වික්‍රමතිලක මහතා

කළමනාකාර සහකාර



එච්.පී. ආරියසිරි මහතා

කළමනාකාර සහකාර



ඒ.එස්.පී. ශිරෝමාල් මහතා

කළමනාකාර සහකාර



පී.එල්.පී. ඉමල්කා මහත්මිය

කළමනාකාර සහකාර



පී.ඒ.සී.එස්.දේවසුරේන්ද්‍ර මහත්මිය

කළමනාකාර සහකාර



ඩබ්ලිව්. රුවන්පතිරණ මහතා

ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරී



ඩබ්ලිව්. සුදර්ශනී මහත්මිය

ජ්‍යෙෂ්ඨ සහකාර ආරක්ෂක නිලධාරී



ඩබ්ලිව්.ඒ.කේ.එස්. ප්‍රියන්ත මහතා

රියදුරු



ඩබ්ලිව්.ඒ.කේ.එස්. හසන්ත මහතා

බැංකු කාර්යාල කාර්ය සහායක



කේ.ඒ.එන්. කුමාර මහතා

බැංකු කාර්යාල කාර්ය සහායක

# ...... පැවැත් වූ වැඩසටහන්.........

*මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් පවත්වන සියලුම වැඩසටහන් සංවිධානය කරනුයේ සංවර්ධන අංශය මගිනි. එම අංශයේ අංශ ප්‍රධානි - සුමුදු ගුණරත්න මහතා විසින් සියලු කටයුතු සංවිධානය හා අධීක්ෂණය කරනු ලැබේ. එතුමන් බොහෝ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ද ලබා දෙනු ලැබේ.*

*තවද සංවර්ධන අංශ කළමනාකරු - එම්.පී.අනුර මහතා හා සංවර්ධන අංශ කළමනාකාරිණි - යූ.ඩබ්ලිව්.ඒ.පී.කේ.වීරරත්න මහත්මිය ද වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරීන් ලෙස කටයුතු කරනු ලැබේ.*

## *විධිමත් මූල්‍ය ආයතන හා සේවාවන්, අනවසර මුදල් ව්‍යාපාර හා තහනම් මූල්‍ය යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව*

- මූල්‍ය පද්ධතියක ක්‍රියාකාරීත්වය, මූල්‍ය අතරමැදිකරණය සහ බැංකු හා මූල්‍ය සේවා පරිසරය හඳුනා ගැනීම.
- මූල්‍ය පද්ධතිය තුළ පවත්නා විධිමත් හා අවිධිමත් මූල්‍ය ආයතන හඳුනා ගැනීම
- ඒවායෙහි පවතින්නා වූ නීතිමය පරිසරය හඳුනා ගැනීම
- පිරමීඩ ව්‍යාපාර ඇතුළු අනවසර මුදල් ව්‍යාපාර හා ඒවායේ මුදල් තැන්පත් කිරීමේ දී පවතින අවදානම හඳුනා ගැනීම

සහභාගී වූ සංඛ්‍යාව: 1111
වැඩසටහන් සංඛ්‍යාව: 10





***2017 ජූලි 14 දින ඉමදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී,***

**ඉලක්ක කණ්ඩායම**: ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, දිවි නැගුම (සමෘද්ධි) නිලධාරීන් හා ආර්ථික සංවර්ධන නිලධාරීන්

**සම්පත් දායකයන්**: මිගාර හඳුන්ගේ මහතා - ප්‍රාදේශීය කළමනාකරු,- මාතර

එම්.පී.අනුර මහතා - කළමනාකරු (සංවර්ධන අංශය)






***2017 ජූලි 21 දින බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී,***

**ඉලක්ක කණ්ඩායම**: ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, දිවි නැගුම (සමෘද්ධි) නිලධාරීන් හා ආර්ථික සංවර්ධන නිලධාරීන්

**සම්පත් දායකයන්**: මිගාර හඳුන්ගේ මහතා - ප්‍රාදේශීය කළමනාකරු,- මාතර

එම්.පී.අනුර මහතා - කළමනාකරු (සංවර්ධන අංශය)




***2017 ජූලි 25 දින ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී,***

**ඉලක්ක කණ්ඩායම**: ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, දිවි නැගුම (සමෘද්ධි) නිලධාරීන් හා ආර්ථික සංවර්ධන නිලධාරීන්

**සම්පත් දායකයන්**: මිගාර හඳුන්ගේ මහතා - ප්‍රාදේශීය කළමනාකරු,- මාතර

එම්.පී.අනුර මහතා - කළමනාකරු (සංවර්ධන අංශය)




***2017 අගෝස්තු 14 දින කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී,***

**ඉලක්ක කණ්ඩායම**: ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, දිවි නැගුම (සමෘද්ධි) නිලධාරීන් හා ආර්ථික සංවර්ධන නිලධාරීන්

**සම්පත් දායකයන්**: එන්.ඒ.ඒ. විජේසිරි මහතා- ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ- නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව




***2017 සැප්තැම්බර් 19 දින මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී,***

**ඉලක්ක කණ්ඩායම**: ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, දිවි නැගුම (සමෘද්ධි) නිලධාරීන් හා ආර්ථික සංවර්ධන නිලධාරීන්

**සම්පත් දායකයන්**: මිගාර හඳුන්ගේ මහතා - ප්‍රාදේශීය කළමනාකරු, මාතර

එම්.පී.අනුර මහතා - කළමනාකරු (සංවර්ධන අංශය)




***2017 සැප්තැම්බර් 21දින ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී,***

**ඉලක්ක කණ්ඩායම**: ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, දිවි නැගුම (සමෘද්ධි) නිලධාරීන් හා ආර්ථික සංවර්ධන නිලධාරීන්

**සම්පත් දායකයන්**: එන්.ඒ.ඒ. විජේසිරි මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ - නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව

එම්.පී. අනුර මහතා - කළමනාකරු (සංවර්ධන අංශය)




***2017 සැප්තැම්බර් 22 දින බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී,***

**ඉලක්ක කණ්ඩායම**: ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, දිවි නැගුම (සමෘද්ධි) නිලධාරීන් හා ආර්ථික සංවර්ධන නිලධාරීන්

**සම්පත් දායකයන්**: එන්.ඒ.ඒ. විජේසිරි මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ - නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව

එම්.පී.අනුර මහතා - කළමනාකරු (සංවර්ධන අංශය)





***2017 ඔක්තෝබර 27 දින පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී,***

**ඉලක්ක කණ්ඩායම**: ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, දිවි නැගුම (සමෘද්ධි) නිලධාරීන් හා ආර්ථික සංවර්ධන නිලධාරීන්

**සම්පත් දායකයන්**: මිගාර හඳුන්ගේ මහතා - ප්‍රාදේශීය කළමනාකරු- මාතර

එම්.පී.අනුර මහතා - කළමනාකරු (සංවර්ධන අංශය)

# *ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම සහ පිරිසිදු මුදල් භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන*

මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් සඳහා සංවිධානය කරනු ලැබූ "ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම සහ පිරිසිදු මුදල් භාවිතය" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2017 සැප්තැම්බර් මස 20 වන දින පෙ.ව. 9.00 සිට මාතර ප්‍රාදේශීය කාර්යාලයේ දී පැවැත්විණි.

මෙම වැඩසටහනේ අරමුණ වුයේ; ව්‍යවහාර මුදල් නෝට්ටුවල ගුණාත්මකභාවය ඉහළ මට්ටමක පවත්වා ගැනීමත්, එමගින් සත්‍ය සහ ව්‍යාජ මුදල් නෝට්ටු වෙන් වෙන්ව හඳුනා ගැනීමත්, පිරිසිදු මුදල් භාවිතය ප්‍රවර්ධනය කිරීම හා මුදල් කළමනාකරණය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා දීමත්ය.





# මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්

මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳව ප්‍රාදේශීය මට්ටමින් ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සෑම වසරකදීම, සම්පත් දායකත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ලබාගෙන පැවැත්වීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය කටයුතු සංවිධානය කරයි.

ඒ අනුව, මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳව ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 09 ක් 663 පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවනාගාරයේ දී 2017.09.11 දී පවත්වන ලද වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ඩී.එම්.කේ.බී. දුනුතිලක මහතා විසිනි.



ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවනාගාරයේ දී 2017.09.11 දී පවත්වන ලද වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ඩී.එම්.කේ.බී. දුනුතිලක මහතා විසිනි.



අගුණුකොලපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී හා වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී 2017.09.07 දී පවත්වන ලද වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ඒ.ජී.ආර්.අබේකෝන් මහතා විසිනි.



# ...... ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්.........

## *සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා හඳුන්වා දී ඇති සහන පොළී ණය යෝජනා ක්‍රම හා සම්බන්ධ වැඩසටහන්*





2017.07.25 දින, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා හඳුන්වා දී ඇති සහන පොළී ණය යෝජනා ක්‍රමවල මෙහෙයුම් විධි විධාන පිළිබඳව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී, එම දිස්ත්‍රික්කයේ සහභාගීත්ව මූල්‍ය ආයතන නිලධාරීන් දැනුවත් කිරීම සිදුකරන ලදී.

ප්‍රාදේශීය කළමනාකාර මිගාර හඳුන්ගේ මහතාගේ උපදෙස් පරිදි සංවිධානය කළ මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ලබාදුන්නේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඒ.එම්.ආර්.කේ. අත්තනායක මහතා විසිනි





ණය ආපසු ගෙවීම් වල අක්‍රමිකතා පවතින සහ ආපදාවන්ගෙන් හානියට පත් ස්වයං රැකියා සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ණය උපදේශන සේවා වැඩසටහන 2017.09.25 දින දී ප්‍රාදේශීය කළමනාකාර මිගාර හඳුන්ගේ මහතාගේ උපදෙස් පරිදි, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී.

සම්පත් දායකත්වය - මහින්ද වික්‍රමසිරි මහතා - ණය උපදේශක, ණය උපදේශන සේවා ඒකකය, රාජගිරිය

# පුහුණු වැඩසටහන්

පසු විපරම් කටයුතුවල දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ව්‍යාපාරවල ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යාමේ නොදැනුවත්කම, මූල්‍ය පහසුකම් ලබා ගැනීමට මෙන්ම එදිනෙදා ව්‍යාපාර දියුණුවට ඇති ප්‍රධාන බාධාවක් ලෙස හඳුනාගෙන, එයට විසඳුමක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දී ඇති ස්වශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී සිටි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා “ව්‍යවසායකයෙකු තම ව්‍යාපාර පවත්වාගෙන යාමේ දී ගිණුම් තැබීමේ ඇති වැදගත්කම සහ මූලිකව ගිණුම් තබා ගන්නා ආකාරය” පිළිබඳව පුහුණු වැඩසටහන් මාලාවක් රුහුණු විශ්වවිද්‍යාලයේ, කළමනාකරණ හා මූල්‍ය පීඨයේ කථිකාචාර්ය- ආර්.ආර්.පී.කේ.ගුණරත්න මහතාගේ සම්පත් දායකත්වයෙන් පවත්වන ලදී.

***මාතර දිස්ත්‍රික් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා 2017 ජූලි 31 දින දී අප කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ වැඩසටහන,***





***හම්බන්තොට දිස්ත්‍රික් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා 2017 අගෝස්තු 16 හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී,***





ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා මෙහෙය වූ,

"ධනාත්මක ආකල්ප සංවර්ධන හා පෞරුෂ වර්ධන" වැඩසටහන් මාලාව

***හම්බන්තොට දිස්ත්‍රික් වැඩසටහන 07-09-2017***



***ගාල්ල දිස්ත්‍රික් වැඩසටහන 31-10-2017***



# <u>නව තාක්ෂණය හදුන්වාදීම</u>

2017 ජූලි 26 දින අප ප්‍රාදේශීය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ ආහාර නිෂ්පාදනයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ඇසුරුම්කරණය පිළිබඳ නව තාක්ෂණික දැනුම ලබා දීමේ පුහුණු වැඩසටහන,





එළවළු හා පළතුරු විජලනීකරණය කිරීම පිළිබඳව නව තාක්ෂණික දැනුම ලබා දීමේ පුහුණු වැඩසටහනක් 2017 අගෝස්තු 31 දින දී අනුෂා ගමගේ මහත්මියගේ සම්පත් දායකත්වයෙන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ දී පවත්වන ලදී.






ඇසුරුම්කරණය පිළිබඳ නව තාක්ෂණික දැනුම ලබා දීමේ තවත් පුහුණු වැඩසටහනක් 2017 නොවැම්බර් 17 දින අප ප්‍රාදේශීය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.






මැටි ආශ්‍රිත කර්මාන්තවල නියතු ව්‍යවසායකයන් සඳහා අගය එකතු කළ නිෂ්පාදනයන් හා නව තාක්ෂණය හඳුන්වා දීමේ වැඩසටහන අදියර දෙකක් යටතේ 2017.10.02 හා 2017.10.16 දෙදින තුළ වීරකැටිය, උඩුකිරිවල ප්‍රජා ශාලාවේ දී සාර්ථකව පවත්වන ලදී.









# <u>ක්ෂේත්‍ර චාරිකාවන්</u>

2017 නොවැම්බර් මස 01 දින සාර්ථකව නිමා කරන ලද ඇඟළුම් කර්මාන්තයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා කොග්ගල යුනිචෙලා ගාර්මන්ට්ස් ආයතන පරිශ්‍රය තුළ පැවැත් වූ අධ්‍යාපනික ක්ෂේත්‍ර චාරිකාව.








# හැකියාවට ඉඩක්

**මාතර ප්‍රාදේශීය කාර්යාලය**

ශ්‍රී ලංකා මහ බැංකු මැණියගේ - ප්‍රථම දරුවා ලෙස උපත ලබා
සැලසුවා අපමණ සේවයක් - දකුණුලක ජනයාට
හඳුන්වාදෙමින් මහ බැංකු කාර්යභාරය - අවැසි ලෙස දැනුවත් කරමින්
පුද්ගල හැකියාව ඔප් නංවමින් - සැපයුවා නිවැරදි මාර්ගෝපදේශකත්වය
අඩු පොලී ණය ක්‍රම හඳුන්වා දෙමින් - වෙළඳපල අවස්ථා විවර කර දෙමින්
සැපයුවා දියුණුවට අත්වැල - දිරියට සවියක් වූවා නිබඳවම
සුහදත්වය, මනුෂ්‍යත්වය අගයමින් - සැමට එකලෙස සලකමින්
දිනුවා ජනයාගේ සිත් සතන් - ලැබුවා ආදරය, ගෞරවය
මාතර ප්‍රාදේශීය කාර්යාලය - සැමදින

***රේඛා හෙට්ටිආරච්චි මිය***




**මහ බැංකුව ගමට !!!**

| | | | |
|---|---|---|---|
| නැඟී සිටින්නට වෙර දරණා | අයට | දුර ගම් පළාත්වල වෙසෙනා දනන් | හට |
| තම රැකියාව සරිකර ඉහළට | යන්ට | මුදල් හදල් පරිහරණය | කරන්නට |
| දුරුකර දිළිඳුකම දෙපයින් | නැගිටින්ට | වියදම් මෙන්ම ඉතිරිය කළ යුතු | බවට |
| සවියක් වුණා මහ බැංකුව මේ | සැමට | ගෙන දෙයි දැනුම තම දිවි සරි කර | ගන්ට |
| | | | |
| පළමු ශාඛාව ගෙන ගොස් | මාතරට | පුහුණුව සමග නව දැනුම ද ලබා | දෙමින් |
| නවෝදයක් ලැබ දුන්නා | දකුණටම | අලෙවි පහසුකම් මංපෙත් කියා | දෙමින් |
| ගම්බිම් සිසාරා ඇති කළ | පිබිදීම | සුළු කර්මාන්ත දියුණට මං | සළසවමින් |
| කැපවුන හැමෝටම ගෙන දෙයි | සැනසීම | ගෙන දෙයි ප්‍රබෝධය !!! දකුණම | පුබුදුවමින් |

***දේවිකා ආරියතිලක මිය***

**දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව**

**මාතර ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ මුදල් කෞතුකාගාරයේ තිබෙන අමුත්තන්ගේ සටහන් පොතෙන් හමුවූ සොඳුරු සටහන් කිහිපයක්.....**

පාසල් සිසුන් විසින් තබන ලද නිර්මාණාත්මක සටහන්....



ප්‍රථම සමරු සටහන, විවෘත කිරීමේ උළෙලේ දී අධිපතිතුමන් විසින් තබන ලදී.


VISITORS

1. Congratulations on the opening of this new facility

6th May 2010

## - ඉඩක් ලද මොහොතක ලැබූ විනෝදය -

මාතර ප්‍රාදේශීය කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් සංවිධානය කළ සුහද හමුව ගාල්ල, හරීෂා හොලිඩේ රෙසෝර්ට් හි දී 2017 නොවැම්බර් 04 දින පැවැත්විණි.

එයට සේවා ස්ථාන මාරු ලබා ගිය සාමාජිකයින්, සේවයෙන් විශ්‍රාම ගිය සේවකයින් සහ ඔවුන්ගේ පවුලේ උදවිය ද සහභාගී වූ අතර විනෝද ක්‍රීඩා, සුහද කතා ආදී සතුටු අවස්ථා පැවති දිනක් විය.











